2015 දෙසැම්බර්

**52** වන කලාපය

**ශ්‍රී ලංකා හේතුවාදි සංගමයේ ප්‍රකාශනයකි**

මිල රුපි. **40.00**

# යථාර්ථ

**“*YATHARTHA*”**

**පුවත් ලිපිය - NEWS LETTER**

---

## ආගම හැරයාම හේතුවෙන් අෂ්රෆ් ෆයාද් හට සෞදි අධිකරණයෙන් මරණ දඬුවම !

පලස්තීන කවියෙකු , සමාජ ක්‍රියාධරයෙකු වන අෂ්රෆ් ෆයාධ් , ආගම හැරයාම යන චෝදනාව යටතේ සෞදි අරාබි අධිකරණය විසින් මරණ දණ්ඩනයට නියම කොට ඇත.

අධිකරණය තුලදී නීතිඥ සහය ලබා ගැනීමට ඇති මූලික හිමිකම පවා අහිමි කරමින් පවත්වන ලද (“කැලෑ”) අධිකරණ ක්‍රියාදාමයකින් අනතුරුව ඔහුට මෙම දඬුවම නියම කොට ඇත. සාමාන්‍යයෙන් මෙවැනි දඬුවමක් ක්‍රියාත්මක කරනු ලබන්නේ කඩුවකින් ගෙල සිඳ දැමීමෙනි.

ආගමික විශ්වාසය අත්හැරීම , මොහමඩ් තුමාට නිග්‍රහාත්මක අදහස් දැරීම (මෙය ආගමික පොලීසිය විසින් නිර්වචනය කරන චෝදනාවකි..) සහ කොණ්ඩය වවා තිබීම ආදී චෝදනාවන්ට ඔහු ලක්කොට ඇත.

ආගම යනු කෙනෙකුගේ උත්පත්තියෙන් , දෙමාපිය දේපල අදහන ආගම අනුව පටබැඳුණු යමකි. එය කෙනෙකුගේ අනුදැනුමකින් තොරව ආරෝපණය කරන දෙයකි. විචාරශීලී අයෙකුහට තමන්හට පටබැඳුණු මේ විශ්වාස පද්ධතිය දෙස විචාරශීලීව හා නිදහස්ව කල්පනාකොට එය තවදුරටත් ඇදහීමට හෝ අත්හැරීමට අයිතිය ඇත. එය ලෝක සම්මත සම්මුතියක් වූයේ බොහෝ කලකට ඉහතදීය. සෞදි අරාබිය නම් ගල්යුගයේ පවතින රාජ්‍යයක් විසින් එකී මූලික අයිතිය වටහා නොගැනීම හා ආගමික පොලීසියක් පවත්වාගෙන යාම තේරුම් ගත හැක. එනිසා විය යුත්තේ සෙසු ශිෂ්ට ලෝකය විසින් මේ අශිෂ්ට රාජ්‍යයට දැනෙන තරමේ බලපෑමක් තෙරපුමක් ගෙන ඒමයි; සෙසු ලෝකයේ වෙසෙන ප්‍රගතිශීලී මුස්ලිම් ප්‍රජාව තුලින් මෙවැනි අශිෂ්ට නීති ක්‍රම වලට එරෙහිව හඬක් නැගීමයි.

මීට එරෙහිව IHEU ජාත්‍යන්තර මානවවාදී එකතුව ඇතුළු මානව හිමිකම් සංවිධාන 60 කට අධික ප්‍රමාණයක් සෞදි රජයට බලපෑම් කරමින් ඔහු මෙකී දණ්ඩනයෙන් මුදාහරින ලෙසත් තවදුරත් මෙවැනි නීති පවත්වාගෙන යාමෙන් වැළකී නූතන ශිෂ්ට ලෝකයට පියවර තබන ලෙසත් ඉල්ලා ඇත.

# “හෙණ ගහන අපරාධයකට” ගල් ගසා මරා දැමීම

> ගල් ගසා මරණයට පත්කිරීම ඇරැඹෙන්නේ යුදෙව් ආගමෙනි. ඒ, මීට වසර තුන් දහසකට පෙරයි. ඉස්ලාම් ආගම එම සම්ප්‍රදාය කොපි කෙළේය. මුල් කාලයේ, අපරාධකරුවා පමණක් නොව, ඔහුට හෝ ඇට හිමි බූරුවා/බැටළුවාද ගල් ගසා මරණයට පත්කෙරුණි. අද බූරුවාව නිදහස් කොට මනුෂ්‍යයාට පමණක් ගල් ගසති.

යුදෙව් ආගම යටතේ එදා ගල් ගසා මරණයට පත්කෙරෙන මෙකී ‘‘**හෙණ ගහන අපරාධ**’’ වුණේ මොනවාද?

*උපෝසථ දවසේදී (ඉරිදා) පින් දහම් නොකර වෙනත් වැඩපල කිරීම, දෙවියන්ට අපහාස කිරීම, සමලිංගික සේවනය, ප්‍රතිමා වන්දනාව, කන්‍යාවක් නොවන කාන්තාවක් කන්‍යාවක් බව අඟවා විවාපත් වීම, නගරයේදී හෝ කුඹුරේදී වෙනත් පුරුෂයෙකුට බහ දී ඇති කාන්තාවක් සමග සංසර්ගයේ යෙදීම සහ එළදෙනක් සමග සංසර්ගයේ යෙදීම ආදී වශයෙනි. මේ විකාර ‘**අපරාධ**’ සහ දඬුවම් අද යුදෙව් නීතිය තුළ නැත. එහෙත් ෂරියා නීතිපොත්වල, සමලිංගිකත්වය සහ අනාචාරය වැනි සමහරක් තවමත් ඉතිරි කරගෙන තිබේ.*

ශ්‍රී ලාංකික කාන්තාවක් අනාචාරයේ හැසිරිණැයි කියන චෝදනාවක් මත ගල් ගසා මරා දැමීමට සෞදි අරාබි අධිකරණයක් තීන්දු කොට ඇත. 21 වැනි සියවසක් ගැන මොන තරම් තප්පුලැවත්, අප වනාහී, තවමත් පුරාණ ලෝකයේ තිරශ්චීනත්වයක් සහ වනචාරීත්වයක් ඉවසන නරුම මිනිස් රොත්තක් බව මේ සිද්ධිය අපේ මුහුණටම කියාපායි. ලංකාවේ ‘**ත්‍රස්ත මර්දන පනත**’ වැනි දුෂ්ට නීති ඉවත් කරන්නැයි නිවැරදිවම ඉල්ලා සිටින ශිෂ්ට ලෝකයක්, අහිංසක ගැහැනියක් ගල් ගසා මරා දැමීමට ඉඩ හරින්නේ කෙසේදැයි කියා දිය හැකි ජගතෙක් වේද? ඉරාක මහ පොළොවේ ඇත්තෙන්ම නොතිබුණු ‘**සංහාරක අවියක**’ ව්‍යාජ අවසරය යටතේ ඉරාක පාලකයාව බලහත්කාරයෙන් මැඩලා ඝාතනය කළ ලෝකයක්, තමන් අභිමත පිරිමියෙකු සමග නිදාගැනීමේ වරදට ගැහැනියකට ගල් ගසා මරා දමන සෞදි පාලකයන්ව ඉවසන්නේ කෙසේද යන්න කියා දිය හැකි ජගතෙක් වේද?

මීට කලකට ඉහත සිරියාවේ කාන්තාවක් මේ වරද සම්බන්ධයෙන්, ‘**ඉස්ලාමීය රාජ්‍ය**’ නැමැති වනචාරී කල්ලිය විසින් කඹයකින් බැඳ වධක භූමිය වෙත ඇදගෙන විත් ගල් ගසා මරා දැමෙන වීඩියෝ පටය නැරඹුවොත්, ආගමික අන්තවාදය විසින් ලෝකයා වෙත මුදා හැරෙන ම්ලේච්ඡත්වය ඉදිරියේ නොහඬා සිටීමට කිසි මනුෂ්‍යයෙකු අසමත් වනු ඇත. එම ඝාතනය සිදු කිරීමට අණ දෙමින් ඇගේ ඝාතනය ඉදිරියේ සාක්ෂිකරුවෙකු වශයෙන් ආඩම්බරයෙන් පෙනී සිටින්නේ, සුදෝ සුදුවට හැඳ ගත්, ඇගේම පියා ය. සැම ආගමක්ම එක සමානව ප්‍රතික්ෂේප කරන මේ ලියුම්කරු, **ඕනෑම ආගමක නාමයෙන් කෙරෙන සැම අපරාධයක් සම්බන්ධයෙන්ම එකී ආගමේ සැම සාමාජිකයෙකුම සෘජුව නොවෙතත් වක්‍රාකාරව වගකිව යුතු බව තරයේ අදහයි. මගේ ‘සැබෑ ආගමේ’ ඔවැනි දෙයක් නැත කියා හෝ මා එවැන්නෙකු නොවේ යැයි කියා හෝ අත් හෝදා ගැනීමට කිසිවෙකුට පුලුවන් කමක් නැත. තමාගේ ‘නිවැරදි දහම/ආගම’ වෙනත් පුද්ගලයෙකු හෝ කණ්ඩායමක් හෝ රටක් විසින් වැරදියට පාවිච්චි කරන තාක් කල්, ඒ ‘නිවැරදි’ ආගමිකයන් සියල්ලන්ම අර කී වැරැද්දට වගකිව යුතු වෙයි.** මගේ දරුවා කරන වැරැද්දක් නතර කැරවීම සඳහා ගත හැකි සැම පියවරක්ම නොගන්නා තාක් කල්, පියෙකු වශයෙන් මා

වැරදිකරුවෙකු වන්නා සේ ය. බොදුබල සේනා ෆැසිස්ට්වාදීන් බුදුන්ගේ නාමයෙන් ලංකාවේ මුස්ලිම් ජාතිකයන්ට සහ කතෝලික ජනතාවට පහර දෙද්දී සහ ඔවුන්ගේ දේපල විනාශ කරද්දී ඊට එරෙහිව සෑම බෞද්ධයෙකුම එදා නැගී සිටිය යුතුව තිබුණේ යම් සේ ද, ඒ ආකාරයෙන්ම, ඉස්ලාම් ධර්මයේ නාමයෙන් කෙරෙන මෙවැනි විනාශයන්ට එරෙහිව මුලින්ම නැගී සිටිය යුත්තේද ඉස්ලාම් භක්තිකයන්ම බව අවධාරණයෙන් කිව යුතුය. වාසනාවකට, අද මුළු මහත් ලෝකයම පාහේ (මුස්ලිම් ලෝකයද ඇතුළුව) ‘ඉස්ලාමීය රාජ්‍යය’ කල්ලිය විසින් මුදාහැර ඇති ම්ලේච්ඡත්වයට එරෙහිව නැගී සිටිති. එහෙත්, සෞදි අරාබිය වැනි රටක පවති, නූතන ලෝකයේ නොපැවතිය යුතු නෛතික ම්ලේච්ඡත්වයක්, අනිත් පැත්තෙන් මුළු ලෝකයාම ඉවසා සිටිති. සෞදි අරාබියේ ෂරියා නීතිය අනුව, කෙනෙකු අනාචාරයේ හැසිරුණු බව ඔප්පු කිරීම සඳහා ඇසින් දුටු සාක්ෂිකරුවන්, ගැහැනුන් නම් අට දෙනෙකුද, පිරිමින් නම් හතර දෙනෙකුද, අවශ්‍ය කරන බව කියැවේ. මේ වරද, නීතිය ඉදිරියේ ‘අපරාධයක්’ වශයෙන් සළකන අතරේම එය ඔප්පු කිරීම ඒ සා දුෂ්කර කාර්යයක් බවට පත්කොට ඇත්තේ, දඬුවම අධෛර්යමත් කිරීමට බව කියති. එහෙත් අදාළ කාන්තාව විසින්ම තමන් කළ ‘අපරාධය’ ගැන පාපොච්චාරණයක් කර තිබීම නිසා ඉහත කී සාක්ෂිකරුවන් දැන් අවශ්‍ය නොකරන බවත් දැන ගන්නට ඇත. මේ අහිංසක ගැහැනියගේ ජීවිතය බේරා ගැනීම සඳහා ඉහත කී නීතිමය කරුණු ගැන සැළකිලිමත්ව කටයුතු කිරීමට අපේ බලධාරීන් වගබලා ගත යුතුය. ඒ සම්බන්ධයෙන් වන නීතිමය මැදිහත් වීමක් ලංකාවේ ආණ්ඩුව පැත්තෙන් දැනටමත් සිදු කෙරෙමින් පවතින බව දැන ගන්නට ලැබීම සතුටකි. ඇගේ ජීවිතය, අනාගත විසඳුමක් වෙනුවෙන් අද පරදුවට තැබිය නොහැකි බව අමුතුවෙන් කිව යුතු නැත. එනිසා, සෞදි නීතිය සහ ආණ්ඩුව සමග අපේ බලධාරීන් වහා කාර්ය නියුක්ත විය යුතුව තිබේ.

එහෙත්, මූලික ප්‍රශ්නය අප මගහැරිය යුතු නැත. එනම්, මේ කියන ප්‍රශ්නය අපේ කාන්තාවට පමණක් අදාළ වන හෝ ඇගේ ජීවිතය බේරා ගැනීමකින් පමණක් අවසන් වන ප්‍රශ්නයක් නොවන බව වටහා ගැනීමයි. එබැවින් මේ සම්බන්ධයෙන් විවිධ අය ඉදිරිපත් කරන විසඳුම් ගැන වඩාත් යථාවාදීව බැලීමට අපට සිදුවෙයි. ඒ අතර, ඇතැමුන් කියන්නේ, අපේ කාන්තාවන් සෞදි අරාබියේ සේවයට යැවීම නතර කළ යුතු බවයි. තවත් අය කියන්නේ, එරටට යන අපේ පුරවැසියන්ට එරට නීතිරීති ගැන අවබෝධයක් ලබා දීමට කටයුතු කළ යුතු බවයි. ඊටත් එහාට යන තවත් අය, අපේ පිරිමින්ට සහ ගැහැනුන්ට විදෙස්ගත වීමට හේතු වන්නා වූ ප්‍රශ්නවලට දීර්ඝ කාලීන විසඳුමක් දේශීය වශයෙන් අපේක්ෂා කරති. ඒ අනුව, ලංකාවේ රැකියා අවස්ථා සම්පාදනය කරමින්, ලංකාවේම ගෞරවාන්විත ජීවිකාවක් උපයා ගැනීමේ පසුබිමක් සකස් කළ යුතු බව ඔවුහු පෙන්වා දෙති. මේ සියලු හේතු කාරණා, අදාළ ප්‍රශ්නය තමන්ට බලපාන කෝණයෙන් බලා ඉදිරිපත් කරනු ලබන විසඳුම් වශයෙන් හඳුනාගත හැකිය. එහිදී පවා ඉදිරිපත්ව ඇති ඇතැම් යෝජනා, හුදෙක් හිස් විසඳුම් බව පෙනේ. උදාහරණයක් වශයෙන්, අපේ කාන්තාවන් පිටරට ගෘහ සේවයට යැවීම නතර කරන්නැයි කරන ඉල්ලීම, රටේ ආර්ථිකය පැත්තෙන් ගත්තත්, අදාළ සේවක සේවිකාවන්ගේ පෞද්ගලික පැවැත්ම පැත්තෙන් ගත්තත්, තවත් ප්‍රශ්න රාශියකට මුල පිරීමක් මිස, අපටම වුව, විසඳුමක් වන්නේ නැත. ඔවුන් විදේශගත වීමේ පෙළඹවීම අවම කිරීම සඳහා ලංකාවේම රැකියා කිරීමට හැකියාව ඇති කරන සංවර්ධනයක් ඇති කිරීම, අපේ පැත්තෙන් ගත් විට, ඊට වඩා වැදගත් යෝජනාවකි. එහෙත් එවැන්නක් ගැන බලාපොරොත්තු තබා ගැනීම දුෂ්කර ය. ඊටත් වඩා එය දීර්ඝ කාලීන ය.

ඉහත කී අහිංසක කාන්තාවගේ ජීවිතය බේරා ගැනීමේ ක්ෂනික අවශ්‍යතාවට අමතරව අප ඉදිරියේ මේ හොල්මන් කරන්නේ පොදුවේ මනුෂ්‍යත්වය බේරා ගැනීමේ ප්‍රශ්නයක් බව සිහියට ගැනීම වටී. එල්ලා මැරීමේ දී එම ක්‍රියාව කරන තනි පුද්ගලයෙකු හෝ කිහිප දෙනෙකු අපට හඳුනා ගත හැකිය. ගල් ගසා මැරීමේදී එම ඝාතනය සිදු කරන තනි පුද්ගලයෙකු නොමැත. අහවලා ඝාතකයා යැයි ඇඟිල්ල දිගු කොට පෙන්විය හැකි අලුගෝසුවෙකු එතැන නැත. ඒ වෙනුවට සිටින්නේ ඝාතකයන් සමූහයකි. ශිෂ්ටාචාරය විසින් යුක්තිය ඉල්ලා දීර්ඝ කාලයක් තිස්සේ වර්ධනය කරගත් දණ්ඩ නීති පද්ධතියක් තුළ, මේ ඝාතන ක්‍රියාව හැකි තාක් සමාජයෙන් ඈත් කොට විශේෂිත ආයතනික පද්ධතියක් තුළ, පොලීසිය, නීතිඥයන්, අධිකරණ නිලධාරීන් වැනි සීමිත පිරිසකට පවරා තිබේ. ගල් ගසා මැරීම තුළ ඉහත කී පිරිසට අමතරව සමස්ත සමාජයමත් ප්‍රායෝගිකවම සිටිති. එය තනි ක්‍රියාවක් නොව, සාමූහික සහ සමාජයීය ක්‍රියාවක් බවට පත්කෙරේ. ඒ අනුව, ගල් ගසා මරණයට පත් කිරීම යනු, එක පැත්තකින් ම්ලේච්ඡත්වය මුළු සමාජය පුරාම පැතිරවීමක් වන අතරේ අනිත් පැත්තෙන් ඒ මගින් ම්ලේච්ඡත්වය එහි අන්තයටම ගෙන යාමටත් වගබලා ගනු ලැබේ. උදාහරණයක් වශයෙන්, ෂරියා නීතිය යටතේ මේ ඝාතනය සිදු කරන රටවල නීතියට අනුව, අපරාධකරුවාව/අපරාධකාරියව ඝාතනය කිරීම සඳහා පාවිච්චි කරන ගල්, පමණට වඩා විශාල විය යුතු නැති බවත්, පමණට වඩා කුඩා විය යුතු නැති බවත් සඳහන් ය. පමණට වඩා විශාල විය යුතු නැති බවට පැනවීමක් ඇත්තේ, විශාල ගලකින් වදින තනි පහරකින් එක වර මරණයට පත්වීම වළක්වා ගැනීමටයි. එනම්, අපරාධකරුවා/අපරාධකාරිය උපරිමයෙන් සහ වැඩිම වේලාවක් විඳවිය යුතු බව අර ඝාතක සාමූහිකයෙන් අපේක්ෂා කෙරේ.

සාක්ෂිකරුවන් සියයක් සිටියත්, අනාචාරය වැනි '**වරදක්**', ගල් ගසා හෝ වෙනත් ආකාරයකින් කෙනෙකුව මරණයට පත්කිරීමට තරම් වන '**අපරාධයක්**' යැයි කීමම, සකල ශිෂ්ටත්වය තිරිසන් ලෙසින් පාගා දැමීමකි. මෙය, සමස්ත මනුෂ්‍ය වර්ගයාගේ ජීවිතයට ඇති අයිතිය සමස්ත ලෝකයා විසින්ම ජය ගත යුතු අභියෝගයක් සේ භාර ගැනීම ඉල්ලා සිටින මොහොතකි. හේතුව, ජීවිතය යනු, මොනම දේව ධර්මයකින් හෝ ලෞකික පැනවීමකින්වත් අනෙකෙකු විසින් පැහැර ගත යුතු දෙයක් නොවන බැවිනි. මේ නිසා ලංකාවේ එල්ලුම් ගස ඉල්ලා කෑගසන ස්ත්‍රීන් සහ පුරුෂයන් මේ අහිංසක ගැහැනිය ගල් ගසා මරා දැමීමට එරෙහිව උද්ඝෝෂණය කරන අතරේම, අර කී මූලික මනුෂ්‍යත්වය ගැනත් සිතා බැලීම වටී.



**ගාමිණී වියන්ගොඩ**|

# ආලෝකය හා දෘෂ්ටිය

ආලෝකය කියන්නේ මොකක්ද?

බැලූ බැල්මට පේන්නේ සරල ප්‍රශ්නයක් වගෙයි. ඕක අහන්න තරම් දෙයක්යැ, කවුරුත් දන්නවානේ කියලා හිතන්නත් පුළුවන්. ඒක ඇත්ත. ආලෝකය නැත්නම් අපට අපව වත් පේන්නේ නැහැනේ. ගැටලුව තියෙන්නේ ආලෝකය යනු කුමක්ද කියන එකට සරල, පැහැදිලි කිරීමක් නැති කමයි. ආලෝක වර්ෂ, ආලේක තරංග ආදිය එකතු වෙද්දී මෙය තවත් සංකීර්ණ වෙන බව පෙනේ. කෙසේ වෙතත්, ආලෝකය යයි පෙනීමයි අතර පැහැදිලි සම්බන්ධයක් තිබෙන බවක් හැඟී යයි. ඇත්තටම විද්‍යාඥයන් ආලෝකය කියන්නේ පෙනෙන ආලෝකයටය හෙවත් දෘශ්‍ය ආලෝකයටයි. (visible light) මෙහිදී පෙනෙන ආලෝකය යනුවෙන් දැක්වූයේ මානවයන්ට පෙනෙන ආලෝකයයි. දැන් ඔන්න ප්‍රශ්නය ආයෙත් සංකීර්ණ වෙන බවක් පෙන්නුම් කරයි. පෙනෙන ආලෝකය කියලා වෙන් කරලා දකින්නේ නොපෙනෙන ආලෝකයකුත් තියනවාද?

විද්‍යාඥයන් ආලෝකය හඳුන්වන්නේ විද්‍යුත් චුම්භක විකිරණය (electromagnetic radiation) ලෙසටයි. ආලෝකය යනු විද්‍යුත් චුම්භක විකිරණය කියන තරංග පවුලේ එක සුළු කොටසක් පමණයි. විද්‍යුත් චුම්භක තරංග සියල්ල ගත්තොත් ඊට රේඩියෝ තරංග (මේවාට ඉතා දීර්ඝ තරංග ආයාම තිබේ) මෙන්ම වර්ණාවලියේ අනෙක් අන්තයේ පිහිටි ඉතා කෙටි තරංග ආයාම ඇති ගැමා සහ අන්තරීක්ෂ(cosmic) තරංග අයත් වෙනවා. දෘශ්‍ය ආලෝකය ඇතිවන්නේ වර්ණාවලියේ මැද හරියට වෙන්නයි.

ශක්තිය :

මතක තබා ගත යුතු වැදගත් දෙයක් තමයි, ආලෝකය හා විද්‍යුත් චුම්භක විකිරණයෙහි ශක්තිය ඇති බව. ක්වොන්ටම් සිද්ධාන්තයෙන් කියැවෙන්නේ ආලෝකය ඉතා කුඩා ශක්තිඅංශු පොදිවලින් සමන්විත වන බවයි. මේ කුඩා අංශු විද්‍යාඥයන් විසින් හඳුන්වනු ලබන්නේ පොටෝන(photons) හැටියටයි. පොටෝන සහ ප්‍රෝටෝන(proton) පටලවා ගත යුතු නැත. පොටෝන සංඛ්‍යාව මගින් තිබෙන්නාවූ විකිරණය අපට දන්වනු ලබන අතර තරංග ආයාමය ශක්තිය හා විද්‍යුත් චුම්භක වර්ගය තීරණය කරයි. පොටෝන සංඛ්‍යාව වැඩිවෙද්දී වඩාත් දීප්තිමත් වඩාත් තීව්‍ර ආලෝකයක් ලැබේ. පොටෝන අඩුවන විට ලැබෙන ආලෝකය දුබලය. තීව්‍රතාවයෙන් අඩුය. අපි ඩිමර් ස්විච්යක් භාවිත කර සිදුකරන්නේ ලයිට් බල්බයෙන් නිකුත් කරන පොටෝන සංඛ්‍යාව අඩුකිරීමයි. ආලෝක වර්ගය එකම වුවද ප්‍රමාණය වෙනස් වී තිබේ.

වේගය :

අප දැනට දන්නා පරිදි ආලෝක වර්ග සියල්ලම රික්තකයදී එක වේගයකින් ගමන් කරයි. රික්තකයකදී ආලෝකයේ වේගය තත්පරයකට මීටර 299,792,458 ක් ලෙස දැක්වෙයි. කිලෝමීටර්වලින් කීවොත් දළ වශයෙන් තත්පරයකට 300,000. මෙය ඉතා අධික වේගයකි. කිසිම පදාර්ථයකට ආලෝකයේ වේගය ඉක්මවිය නොහැක්කේ එහෙයිනි. එතරම් වේගයෙන් ගමන් කළ ද අභ්‍යාවකාශයේ දුර ප්‍රමාණ සලකන විට ඒ වේගයද සීමා ඇති බවක් පෙනේ. උදාහරණයකට අපට ආලෝකය සපයන සූර්යකිරණ සූර්යාගේ සිට පෘථිවියට ඒමට තත්පර 500 ක් ගත වෙයි. අපේ ගැලැක්සිය වන ක්ෂිර පථය හරහා එක පැත්තක සිට අනෙක් පැත්තට ආලෝක අංශුවක් ගමන් කිරීමට

වර්ෂ 100,000ක් ගත වෙයි. මේ සියල්ල ගණන් බලා ඇත්තේ රික්තයක ආලෝකය ගමන් ගන්නා වේගයෙනුයි. එහෙත් අපේ වායු ගෝලය, ජලය හෝ දියමන්ති හරහා ආලෝකය ගමන් කරන විට එහි වේගය මන්දාගමී වෙයි. ගණන් බලා ඇති අන්දමට දියමන්ති හරහා ආලෝකය ගමන් කරන්නේ තත්ත්පරයකට මීටර් 124,000,000 ක තරම් අඩු වේගයකින්.

දකින එළිය :

කලින් ද සඳහන් කළ අන්දමට දකින එළිය යනු මිනිස් අපට පෙනෙන ආලෝකයයි. වඩාත් සුවිශේෂීව කීවොත් අප දකින්නේ වස්තුවක් මතට පතිත වී එම වස්තුව මගින් අවශෝෂණය කර නොගන්නා ආලෝකය පමණකි. නිදසුනක් ගතහොත් කොළ පැහැති තාප්පයක් අපට පෙනෙන වර්ණාවලියේ කොළ පැහැය හැර සෙසු වර්ණ (කොළ තරංග ආයාම යයිද කිව හැකිය.) සියල්ල අවශෝෂනය කරයි. අපට එවිට කොළ පැහැය පමණ දර්ශනය වේ. මිනිස් අපට පෙනෙන වර්ණ කීවාට අප අතරේ සමහර අයට වර්ණ සියල්ලම පෙනෙන්නේ නැත. ඒ එම පිරිසගේ ඇස්වල තිබෙන ජානමය දුර්වල කමක් නිසාය. එම දුර්වල කම හැඳින්වෙන්නේ වර්ණාන්ධතාව ලෙසටයි.

පෙනෙන වර්ණ :

දැන් අපි ඇසට පෙනෙන වර්ණාවලියේ වර්ණ හඳුනා ගනිමු. ඒ සඳහා අපට සහය වන්නේ සෑදහ ඨග ඊසඩ මහතායි. ඔහු විද්‍යාඥයෙක්ද? වර්ණ දැකිය හැකි උපකරණයක් නිර්මාණය කළ අයෙක්ද? ඇත්තටම රෝයි ජී. බිව් නමින් චරිතයක් නැත. එය වචනවල මුල් අකුරු යොදා හැදූ නමක් (acronym) ඉන් වර්ණ හතක් ගැන කියැවේ. R (red – රතු), V (violet), O (orange – තැඹිලි), Y (yellow කහ), G (green කොළ), B (blue – නිල්), I (indigo – ඉන්ඩිගෝ), V (violet – දම්) මේ වර්ණ තමයි මිනිස් ඇසට දර්ශනය වන්නේ. මෙහි ඒවා සඳහන් වී ඇත්තේ වර්ණාවලියේ සඳහන් අනුපිළිවෙළටයි. රක්ත වර්ණයෙහි දිගම තරංග ආයාම ඇති අතර කෙටිම තරංග ආයාම ඇත්තේ දම් පාටෙහිය. වඩාත්ම ප්‍රබල දම් වන අතර අඩුවෙන්ම ප්‍රබල රතුයි.

[ උපුටා ගැනීම "තතු" බ්ලොග් අඩවියෙන් ]

විමසීම්;

*තාරක වරාපිටිය*
*226, සයිමන් දියෙස් මාවත , මාදුපිටිය,*
*පානදුර*

0727 449 599
warapitiya@gmail.com

## ෆොසිල් අධ්‍යයන විද්‍යාවට (Paleontology) කෙටි හැඳින්වීමක්

පුරා තත්ත්ව විද්‍යාව (පාෂාණීය ධාතු විද්‍යාව යනුවෙන් ද හැඳින් වේ.) හෙවත් පොසිල අධ්‍යයන විද්‍යාව ක්‍රියාදාම ගණනාවක් මත රඳා පවතී. මුල්ම ක්‍රියාදාමය වැළලෑමයි(burial). පාෂාණ ඉතා කුඩා අංශු මගින් අස්ථි වැළලී යාම මෙම ක්‍රියාදාමය ලෙස දැක්විය හැකියි. දෙවැනි ක්‍රියාදාමය නැතිනම් ක්‍රියාවලිය හැඳින්වෙන්නේ පාෂාණීභූතවීම හෙවත් ෆොසිලවීම ලෙසටයි. වැළලී ගිය අස්ථිය ගල් බවට පත් කරන රසායන විපර්යාසයන් මාලාව ඉන් හැඟ වේ. නිරාවෘතිය හෙවත් නිරාවරණය (exposure) තුන්වැනි ක්‍රියාදාමයයි. කාලය ඉක්මයත්ම, ගල් වූ පාෂාණ අංශු ක්ෂය වී යාමෙන් හෝ චලනයවීමෙන් වසර මිලියන ගණනකට පසුව එකී වැළලී ගිය අස්ථි අනාවරණය වෙයි. පාෂාණී ධාතු විද්‍යාවම ගතහොත් එය ද වෙනස් වර්ගයක ක්‍රියාදාමයකි. ඉන් කියැවෙන්නේ ෆොසිල සොයාගැනීමේ හා දැමීමේ සුපරීක්ෂාකාරී එමෙන්ම සිත් බඳින ක්‍රියාදාමයයි.

පාෂාණභූතවීම හෙවත් ෆොසිල ගතවීම (fossilization) ඛාදනයේ සහ නිධි සාධනයේ චක්‍රය තුළ සිදුවන්නකි. මෙම චක්‍රය කලින් ආපේක්ෂාකළ හැක්කකි. (භාවිකථනීයයි.) එමෙන්ම ගලා යන ජලය හා පෘථිවි කබොල්ල (crust) තරමට පැරණිය. සුළඟින් හා ජලයෙන් පාෂාණ ඛාදනය වන අතර ඉතා කුඩා කැබලිවලට බිඳෙයි. එම කුඩා කැබලි, සිහින් කැට ලෙස සුළඟින්ද අවසාධිත (sediments) ලෙස ජලයෙන් ද රැගෙන යනු ලැබේ. මෙම කොටස් ඒවා රැගෙන යනු ජලය හෝ සුළඟ මගින් දමා යනු ලබන ගං පත්ලේ හෝ කඳු පාමුළ තැන්පත් වේ. වසර මිලියන ගණනාවක් තිස්සේ මෙසේ එකතුවන අවසාදිත මත ඇතිවන අති දැවැන්ත පීඩනය මගින් එකී අවසාදිත පාෂාණ හැටියට බැඳ තබනු ලැබේ. ශල්ක (), බඩගල්, වැලිගල් හා හුණු ගල් අවසාදිත පාෂාණ වර්ගය. මෙකී අවසාදිත පාෂාණ සුළඟට හා ජලයට නිරාවරණය වූ විට ඒවා ඛාදනය වීමට පටන් ගෙන ලිහිල් අංශු හෝ මණ්ඩි සෑදෙන අතර චක්‍රය අඛණ්ඩව සිදුවෙයි. ජීවි ද්‍රව්‍යවල පාෂාණීභූතවීම හෙවත් ෆොසිලකරණය ඉහත කී ඛාදන හා නිධිසාධන චක්‍රය ඇතුළත සිදුවෙයි.

ෆොසිල ගත ඩයිනසෝර අස්ථි වසර මිලියන ගණනාවක් පැරණි ඒවා නිසා ඩයිනසෝර ශේෂයන් ෆොසිලකරණය වූ ආකාරය හඳුනාගැනීමෙන් ෆොසිලකරන ක්‍රියාදාමය ප්‍රායෝගිකව වටහා ගත හැකි වන්නේ ය. පෘෂ්ඨවංශික සතකු ගොඩබිමේදී මියැදුණු විට එම සත්වයාගේ මළකුණ සාමාන්‍යයෙන් කසළශෝධක සතුන් විසින් ඉරා ඇද දමා කැබලි කැබලිවලට කඩා දමනු ලැබේ. කෙසේ වෙතත් මළ කුණ ඉක්මනින් ම මඩ හෝ පස් තුළ වැළලී ගියේ නම් පොසිල ගතවීමේ අවස්ථාවක් ඊට හිමිවන්ට ඉඩ තිබේ. එය ක්ෂණිකව විනාශ වී යන අන්දමට නිරාවරණය වී නොතිබීම ඊට හේතු සාධක වේ. ඩයිනසෝරයෙකු ගං ඉවුරක මියැදුනොත් නැතිනම් ගංවතුරෙන් ඩයිනසෝර මළ කුණක් ජලාශයට රැගෙන යනු ලැබුවොත් ගංගාවේ ඇති මඩ හා රොන් මඩ මගින් සෙමින් එම සතාගේ සිරුර වැසී යනු ලැබේ. මළකුණ මත අවසාදිත එකතුවෙද්දී මළකුණු එන්ට එන්ටම ගං ඉවුරේ ගැඹුරට වැළලෙනු ඇත. නැතිනම්, ගං පත්ලේ සිනිඳු වැල්ලෙන් වැසී යනු ඇත. සත්වයාගේ සිරුරේ මෘදු කොටස් – අවයව, මස් පිඩු හා සම සීඝ්‍රයෙන් දිරා පත් වේ.

එහෙත් අවසාදිතවල ආරක්ෂාව යටතේ සත්වයන්ගේ අස්ථි එලෙසම පවතින්නට පුළුවනි. වසර මිලියන ගණනාවක් යද්දී එක්කාසුවන අවසාදිත මගින් ගලා යන ජලය ඩයිනසෝර අස්ථි මත බලපෑම් ඇති කෙරේ. එම අස්ථිවල ඇති රසායනවලින් සමහරක් ජලය මගින් දියකර හරින අතර වෙනත් රසායනවලින් ඒවා ප්‍රතිස්ථාපන වේ. අස්ථිවල ඇති නව රසායන අස්ථියේ හැඩය හා ප්‍රමාණය සුරක්ෂිත කරන නමුත් ඊට නව මුහුණුවරක්, රසායනික සැකසුමක් ලබාදෙයි. සමහර අවස්ථාවල අස්ථිය එම රසායනික මගින් පාෂාණීභූත කරනු ලබන්නේ සතා ජීවත්ව සිටියදී තිබුණාට වඩා අස්ථිය ඝන හා බර බවට පත්කරවමින් ගල්කරවමිනි. 'නව' පාෂණීභූත අස්ථිය සාමාන්‍යයෙන් මුල් අස්ථියෙහි හැඩයම ඇති අතර අස්ථිය තුළ රුධිර නාල සඳහා වූ ඉඩකඩ පවා එලෙසම තිබෙන තරමට මුල් අස්ථියට සමාන වේ. කාලය ගතවත්ම, අස්ථිය වැළලී ඇති අවසාදිතයන්ට ජලය මගින් ඛනිජ එකතු කිරීමට පුළුවන. ඛනිජ, අවසාදිත එකට බැඳ තබන මැලියමක් ලෙස ක්‍රියාකරයි. අස්ථිය වටා ඇති මෙම අවසාදිත හයිවී පාෂාන බවට පත් වේ. සත්වයාගේ ෆොසිල ගත අස්ථි වටකරගෙන දැන් තිබෙන්නේ එම පාෂාණයයි.

ෆොසිලකරණ ක්‍රියාදාමයේ වෙනත් නැම්මක් ද ඇති විය හැකිය. එහිදී සිදුවන්නේ, ඩයිනසෝරයාගේ ශේෂයන්ගේ අච්චුවක් ඉතිරිව, අස්ථි විනාශ වී යාම යි. සිනිඳු අවසාදිත මගින් අවසාදිත වැසී ගියා යයි සිතමු. අවසාදිත හයිවීමට පටන් ගන්නා අතර මඩ හෝ මැටි මෙන් සතාගේ අවශේෂයන්හි අනුරූපයක් සැකසේ. මෙලෙස මෙකී අවසාදිත තුළ තැන්පත් වී ගත වන වසර මිලියන ගණන්වලදී එම අවශේෂයන් දියවී යා හැකි නමුත් ඒවායේ අනුරූප පාෂාණ බවට හැරවුනු අවසාදිතවල නොමැකී පවතී. එලෙස සෑදෙන අනුරූපය හෝ මුද්‍රාවද අවශේෂයන්ගේ ෆොසිලයකි. එ මතු ද නොව, එමගින් පාෂණීධාතු විද්‍යාඥයන්ට () තොරතුරු සම්භාරයක් ලබා ගත හැකිවේ. ඩයිනසෝර සැකිල්ලෙන් මෙන්ම එය වටකොට ගෙන ඇති පාෂණයෙන්ද වැදගත් තොරතුරු ලබා ගත හැකි යයි පාෂණධාතු විද්‍යාඥයෝ විශ්වාස කරති. මේ අනුව අපට මෙලෙස කිව හැකියි: ***පාද ලාංඡනයක් පෙන්වීමෙන් මේ මාදිලියේ ෆොසිල අපට ඉතා ඉපරණි පාදයක් ගැන කරණු කියාදෙයි.***

අවසාදිත පාෂාණයෙහි ව්‍යුහය අවසාදිත තැන්පත් කරන ලද ජලය පිළිබඳ තොරතුරු සපයයි. අවසාදිතයේ කණිකාවල ප්‍රමාණයෙන් ජලයේ වේගය මිනිය හැකිය. සෙමින් ගලන ජලය හේතුවෙන් අවසාදිතවල කණිකා සිදුම් වේ. වේගය ගැන ජලයට ශක්තිය ඇති නිසා වඩා විශාල අංශු ගෙන යා හැකිවේ. මේ අනුව. සත්ව අවශේෂය සොයා ගනු ලැබුවේ සෙමින් ගලන ජලයෙන් තැන්පත් කෙරුණු සිහින් කණිකා සහිත අවසාදිතවල නම් ඩයිනසෝරයා මිය යන්නට ඇත්තේ ජලයට නුදුරු තැනක යයි අනුමාන කළ හැකියි. ෆොසිල අධ්‍යයනය රහස් පරීක්ෂා ගවේෂණ මෙන් අපූරුය.

උපුටා ගැනීම ''තතු'' බ්ලොග් අඩවියෙන්

# ශ්‍රී ලංකාවේ බල ධුරාවලිය මුදුන සංස්කෘතික මලබද්ධයෙන් පෙලෙයි !

පසුගියදා කොළඹ පවතී සංගීත සංදර්ශනය අවස්ථාවේ වූ සිදුවීම් කිහිපයක් දේශපාලන සමාජයේ හා මාධ්‍ය සමාජයේ කතාබහට පාත්‍ර වී ඇත. ලංකාවේ සංගීත සංදර්ශන අවස්ථාවන්හිදී සිදුවන කෝලාහල හා මිනීමැරුම් පිළිබඳව පවා නොමැති අවධානයක් මේ සිදුවීමට අදාලව යොමුවීමට හේතුවූ සමාජ මනෝභාවය හා මේ අරබයා උග්‍ර විරෝධය පාන ඊනියා සුචරිතවාදීන්ගේ හා සංස්කෘතිකවාදීන්ගේ දෙබිඩි බව හෙළිදරව් කිරීම සමාජයේ විචාරශීලීත්වය අවදි කිරීමට අදාළ මෙහෙවරකි. තරුණියක් ප්‍රසිද්ධියේ ජනප්‍රිය ගායකයෙකු සිපගැනීමට වඩා සංස්කෘතික විරෝධී, සමාජ විරෝධී කාරණය වන්නේ එවැනි සංදර්ශනයකදී මිනීමැරීමක් සිදුවුවහොත්ය. මේ සිදුවීමට එරෙහිව මඩුවලිගය අතට ගන්නට යෝජනා කිරීම තුලින් අපි උත්කර්ෂයට නංවන්නේ පසුගිය පාලන වකවානුවේ සමාජයේ ආධිපත්‍යය දැරූ ආධානග්‍රාහී , පසුගාමී සංස්කෘතික කල්ලි විසින් නඩත්තු කරන ලද සමාජ මනෝභාවය යලි උද්දීපනය කිරීමට අදාළ වැඩ කොටසකි. සංකෘතික විරසක භාවය ගොඩනැගීම යනු ජාතිවාදය හෝ ආගම්වාදය තරම් නොවනමුත් පසුගාමී සමාජ/සංස්කෘතික පිලලයකි. මෙවැනි චුල කරුණු හමුවේ මාධ්‍ය තුලින් වීරයින් වීමට වහසිබස් දොඩවන්නේ වඩා බරපතල සමාජ ප්‍රශ්න හමුවේ පලායන්නන්ය.

ශ්‍රී ලංකා හේතුවාදී සංගමය ලෙස අප යෝජනා කරන්නේ සෞදි අරාබියේ මෙන් කලා සහ මතවාදී සංස්කෘතික පොලීසි අප රටේ පිහිටුවීමට වෑයම් කිරීම තුලින් සමාජයේ ගුණාත්මක රසවින්දනය ඔසවා තැබිය නොහැකි බවයි. යෞවනය යනු ජෛව විද්‍යාත්මක ගත්විට පවා උද්යෝගිමත් උද්වේගකර අවධියක් වෙයි.ශෘන්ගාරය කූටප්‍රාප්ත වන අවදිය වෙයි. එම උද්යෝගිමත් උද්වේගකර යෞවනය වඩා ගුණාත්මක ආකාරයට මුදාහැරීමට අවශ්‍ය සංස්කෘතික අවකාශයක් ලංකාව වැනි අර්ධ පසුගාමී සමාජ වල නොමැති නිසා මේ අකාරයේ අවරගණයේ ලක්ෂණ පෙන්නුම් කරමින් පුපුරා යයි. කෙසේමුත් මෙවැනි ආකාරයේ සංදර්ශන වලට හෝ ප්‍රසිද්ධියේ කරන සිපගැනීම් වලට සදාචාරමය වශයෙන් අප බියනොවිය යුතුය;සසල නොවිය යුතුය. මෙම තත්වයට මුහුණදෙමින් ,මෙය අභියෝගයක් ලෙස භාරගනිමින් වඩා හරවත් හා ගුණාත්මක සංස්කෘතික ජීවිතයක් යෞවනයට උදාකරලීම සඳහා අවශ්‍ය සංස්කෘතික අවකාශයක් ගොඩනැගීමට අවශ්‍ය මැදිහත්වීම කල යුත්වෙයි.

සමාජයේ සංස්කෘතික ජීවිතය ගර්හිත වෙයි නම් ඊට හේතුවන්නේ හුදෙක් තනිතනි පුද්ගලයින්ගේ නොහික්මුණු බව නොවේ. එය සමස්ත සමාජයේම පිළිබිඹුවකි. වර්තමානයේ පවතින ප්‍රබලම සංස්කෘතික සන්නිවේදන ප්‍රවාහය වන ටෙලිවිෂන් නාලිකා වලින් විකාශය වන්නේ ඉතාම බාල ගනයේ, අවරගණයේ ටෙලි නාට්‍යය හා වැඩසටහන් වෙයි. එවැනි දේ වලින් දුෂ්පෝෂණය වන අවරසික සංස්කෘතික ජීවියෙකු වෙතින් බලාපොරොත්තු විය හැක්කේ මෙවැනි ආකාරයේ අවරසික සංස්කෘතික ජීවිත සහිත සමාජයකි.

ශ්‍රී ලංකා හේතුවාදී සංගමය
2015-12-30

# ෆෞසියා ඉල්ලියාස් ස්වයං පිටුවහළේ !

පකිස්ථානයේ අදේවවාදී සංවිධානය ( AAAP) පිහිටුවීමට මුල්වූ ෆෞසියා ඉල්ලියාස් මහත්මියට රට හැරයාමට සිදුවුයේ එරට ලාහෝර් අධිකරණය විසින් ඇයට එරෙහිව ආගමික අපරාධ චෝදනාවක් එල්ල කරමින් නීති ක්‍රියාමාර්ගයකට මුලපිරීම හේතුවෙනි. මෙම AAAP සංවිධානය බ්‍රිතාන්‍යය පදනම් කොටගෙන ඇති මුස්ලිම් ආගම හැරගිය අයගේ සම්මේලනයට අනුබද්ධ සංවිධානයකි. අපේක්ෂා කළහැකි අයුරින්ම අයගේ මෙම ක්‍රියාමාර්ගය හේතුවෙන් එරට නීතියෙන් හා එරට ක්‍රියාත්මක වන අන්තවාදී කල්ලි වලින් ඇයට තර්ජන එල්ල වුනි. අයගේ මෙම නිර්භීත ප්‍රවේශය අන්තවාදීන් කුපිත කරවන්නක් වීම නොවැලැක්විය හැකිය.

පකිස්ථාන නීති පද්ධතිය තුල පවතින කුප්‍රකට දේවාපහස අපරාධ නීතියට අනුව ඇය අත්අඩන්ගුවට ගැනීම පිණිස අධිකරණය වරෙන්තු නිකුත් කළේය. ඒ සමගම ඇය නෙදර්ලන්තය වෙත පලා ගියාය.

ඇය වෙත දේශපාලන රැකවරණය ලබාදෙන මෙන් පකිස්ථානයේ AAAP ( Athiest & Agnostic Alliance Pakistan ) සංවිධානය නෙදර්ලන්ත රජයෙන් ඉල්ලීමක් කොට ඇත. ඇය යලි පකිස්ථානය වෙත ඒමට සිදුවුවහොත් ඇයගේ ජීවිතයට අවදානමක් ඇති බව ප්‍රත්‍යක්ෂ කාරණයකි.

[ IHEU පුවත් ඇසුරිනි ]

*ජීවිත අවධානම නොතකා අවිචාරයට එරෙහිව අරගලයක යෙදුනු අෂ්රෆ් ෆයාද්*

